# රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

**பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு**

**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை
Independence Square, Colombo 07, Sri Lanka


මගේ අංකය / எனது இல / My No: MPA/HRD/HR09/2024
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.02.07

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන වල සභාපතිවරුන්

**<u>රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2018/01/24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 හා 2023/11/30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018(1) වෙත ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. ඒ අනුව, මෙම චක්‍රලේඛ විධිවිධාන අනුව ක්‍රියා කිරීමට ඔබ යටතේ ඇති සියලුම ආයතන වල කාර්ය මණ්ඩල වලට අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ලබා දීමටත් නිසි මෙහෙයුම් කටයුතු සිදු කිරීමටත් පියවර ගන්නා මෙන් දන්වා සිටිමි.

03. තවද, ඔබගේ ආයතනයේ නිලධාරීන් ගේ ධාරිතා සංවර්ධනය උදෙසා මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම හා පුහුණු වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම දැරීම සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර අදාල නිලධාරියාගේ නම, තනතුර, දුරකථන අංකය හා විද්‍යුත් තැපැල් ලිපිනය පිළිබඳ තොරතුරු මෙම අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධන අංශය වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

04. එමෙන්ම, ඔබ ආයතනය සඳහා 2024 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද මානව සම්පත් සංවර්ධන සැලැස්මේ මෘදු පිටපතක් hrdpubadgovlk@gmail.com විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කරන්නේ නම් මැනවි.

05. රාජ්‍ය සේවයේ මානව සම්පත් සංවර්ධනය සඳහා ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය


දුරකතන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: info@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.pubad.gov.lk